(අටවැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක 79.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2016 ජූනි මස 22 වැනි බදාදා අ. භා. 1.00 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

9/'15

1.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) 2015.08.18 දින ගාල්ල වරාය පොලිසිය කරන ලද පරීක්ෂා කිරීමක දී වරායේ ගාල් කර තිබූ "මහනුවර" නමැති නෞකාව තුළත්, ශ්‍රී ලංකා දක්ෂිණ නෞකා කඳවුරේ සහ එහි සේවා වනිතා ඒකකය සතු ගොඩනැගිල්ලක අවි සහ උණ්ඩ තිබී හමු වූ බවත් එතුමා දන්නෙහිද?

(ආ) (i) පොලිසිය මඟින් අනාවරණය කරගත් අවි සහ උණ්ඩවල නීත්‍යානුකූල අයිතිය කවර පුද්ගලයෙකු හෝ ආයතනයක් සතු වන්නේද;

(ii) එම අවි ආයුධ පුද්ගලයෙකුට හෝ ආයතනයකට කවර පනතක් යටතේ පවරා තිබේද;

(iii) එසේ නම්, ඊට බලය ලබා දුන් බලධරයා කවුරුන්ද;

(iv) එම ආයුධ නිෂ්පාදිත රට, වර්ෂය සහ බලපත්‍රය කවරේද;

(v) ආයුධ මිලදී ගත් ක්‍රමය සහ වැය කර ඇති මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙම පාවෙන අවි ගබඩාව වරාය පරිශ්‍රයේ පවත්වාගෙන යාමට අවසර තිබේද;

(ii) ඊට අවසර ලබා දී ඇති බලධරයා කවුරුන්ද;

(iii) ඒ වෙනුවෙන් ඇවන්ට්ගාර්ඩ් සමාගම මුදල් ගෙවන්නේද;

(iv) එසේ නම්, එම මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) (i) මේ පිළිබඳව නීතිපතිවරයාගේ නිගමනයන් විෂයභාර අමාත්‍යවරයා වශයෙන් පිළිගන්නේද;

(ii) මේ සම්බන්ධයෙන් පාර්ලිමේන්තු කමිටුවක් පත් කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

102/'15

2.

ගරු බුද්ධික පතිරණ මහතා,— වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) නිල්වලා ගඟේ හා ගිං ගඟේ ජලය මහ හම්බන්තොට සංවර්ධන කලාපයට ගෙන යෑමේ ව්‍යාපෘතියට අනුව, හම්බන්තොට දිස්ත්‍රික්කයට ගෙන යෑමට බලාපොරොත්තු වන ජල ප්‍රමාණය කොපමණද;

(ii) එම ව්‍යාපෘතියේ සැලසුම ඉදිරිපත් කරන්නේද;

(iii) මෙම ව්‍යාපෘතිය හේතුවෙන් ගාල්ල හා මාතර දිස්ත්‍රික්වල පරිසරයට සිදුවන බලපෑම පිළිබඳ පාරිසරික වාර්තාවක් සකස් කර තිබේද;

(iv) එසේ නම්, එම වාර්තාව ඉදිරිපත් කරන්නේද;

(v) මෙම ව්‍යාපෘතියෙන් නිල්වලා ගඟට කරදිය මිශ්‍රවීමේ අවදානම පාලනයට ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

333/'15

3.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) විශ්වවිද්‍යාලවල අනධ්‍යයන උප ශාලාධිපතිවරුන් සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් යෝජනා කරනු ලබන අනුමත නිවාඩු ප්‍රමාණයන් කවරේද;

(ii) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ චක්‍රලේඛ අංක 912/1ට අනුව දින 90ක්ව පැවති වාර්ෂික නිවාඩු ප්‍රමාණය දින 45 දක්වා අඩු කර තිබේද;

(iii) එසේ නම්, එයට හේතුව කවරේද;

(iv) නැවත අංක 04/2003 චක්‍රලේඛය අනුව සාමාන්‍ය රජයේ නිවාඩු, සෙනසුරාදා, ඉරිදා, සහ පෝය දිනද ඇතුළත්ව දින 90ක් දක්වා එම නිවාඩු ප්‍රමාණය වෙනස්කර තිබේද;

(v) එසේ නම්, ඒ මන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) රජයේ සේවකයන්ට හිමි නිවාඩුද ඔවුන්ට හිමි දින 90 තුළට ඇතුළත්කර සැලකීමෙන් එම සේවකයන්ට, වෙනත් සාමාන්‍ය සේවකයින්ට ලැබෙන වරප්‍රසාදයක් අහිමි කර ඇති බව පිළිගන්නේද;

(ii) සාමාන්‍ය රජයේ සේවකයින්ට හිමි නිවාඩු වරප්‍රසාද කප්පාදු නොකර, විශ්වවිද්‍යාල අනධ්‍යයන උප ශාලාධිපතිවරුන් සඳහා නිවාඩු ලබාදීමේ පිළිගත් ක්‍රමවේදයක් සකස් කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

351/'15

4.

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) ලංකාපුත්‍ර සංවර්ධන බැංකුව මගින් ට්‍රයිස්ටාර් ඇපරල් එක්ස්පෝර්ට්ස් (පෞද්.) සමාගමට රුපියල් මිලියන 530ක ණය මුදලක් ලබා දී තිබේද;

(ii) එසේ නම්, ඒ කවර පදනමක් යටතේද;

(iii) එම ණය මුදල ලබාදීමෙන් අපේක්ෂිත අරමුණු ඉටුවී තිබේද;

(iv) එසේ නම්, ඒවා කවරේද;

(v) නොඑසේ නම්, එම මුදල එම සමාගමෙන් අයකර ගැනීමට ගත් පියවර කවරේද;

(vi) මේ වනවිට ගෙවා ඇති මුදල කොපමණද;

(vii) නොගෙවූ මුදල අය කර ගැනීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පසුගිය ජනාධිපතිවරණ සමයේ දී ලංකාපුත්‍ර සංවර්ධන බැංකුව විසින් රුපියල් ලක්ෂ 700ක මුදලක් පිළිගත් ක්‍රමවේදයකින් තොරව ලබා දී තිබේද;

(ii) එසේ නම්, එම මුදල අයකර ගැනීම සඳහා ක්‍රියාපිළිවෙළක් තිබේද;

(iii) එසේ නම්, එම ක්‍රියාපිළිවෙළ කවරේද;

(iv) එහි වර්තමාන තත්ත්වය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

392/'15

5.

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) 2014 වසරේදී ලංකාවට ආනයනය කළ ඉන්ධන ලෙස හීලියම්, හයිඩ්‍රජන් සහ විදුලිය සම්පූර්ණයෙන්ම භාවිතා කරන වාහන සංඛ්‍යාව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) හීලියම් පමණක් භාවිතා කරන වාහන වාණිජ මට්ටමින් වෙළඳපොළට හඳුන්වා දී ඇති සමාගම් සහ එකී වාහන වෙළඳපොළට හඳුන්වා දුන් වර්ෂය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) හයිඩ්‍රජන් පමණක් භාවිතා කරන වාහන වාණිජ මට්ටමින් වෙළඳපොළට හඳුන්වා දී ඇති සමාගම් සහ එකී වාහන වෙළඳපොළට හඳුන්වා දුන් වර්ෂය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) හයිඩ්‍රජන් සහ හීලියම් පමණක් භාවිතා කරන වාහනවල අවම මිල වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

408/'16

6.

ගරු බන්දුල ගුණවර්ධන මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) අංක S/C 2008 සහ 2008.10.24 දිනැති ශ්‍රේෂ්ඨාධිකරණ නඩු තීන්දුව අනුව, භාණ්ඩාගාර විවිධ වියදම් වැය අයිතම (TMV) මඟින් ලබා දෙනු ලබන විශේෂිත ප්‍රතිපාදන, අදාළ අමාත්‍යාංශය සඳහා වන අතිරේක ප්‍රතිපාදනයන් වේ. 2008 විසර්ජන පනතේ 6(1) වගන්තිය ඒ අනුව සංශෝධනය කරන ලද බව එතුමා දන්නෙහිද?

(ආ) (i) උක්ත කරුණු අනුව 2015 වර්ෂය තුළදී අතිරේක ප්‍රතිපාදන ලබා දුන් අමාත්‍යාංශ කවරේද;

(ii) අමතර ප්‍රතිපාදන ලබාදුන් අරමුණු එක් එක් අමාත්‍යාංශය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එසේ ලබාදුන් අතිරේක ප්‍රතිපාදන ප්‍රමාණය එක් එක් අමාත්‍යාංශය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) විශේෂ වියදම් ඒකක වන අතිගරු ජනාධිපතිතුමා, අග්‍රාමාත්‍ය කාර්යාලය සහ උපරිමාධිකරණ විනිශ්චයකාරවරු යන අයිතමයන් සඳහා 2015 වර්ෂයේදී අතිරේක ප්‍රතිපාදනයන් ලබා දුන්නේද;

(ii) එසේ නම්, එම ප්‍රමාණයන් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

422/'16

7.

ගරු විජිත හේරත් මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2015 ජනාධිපතිවරණයේදී රජයේ සේවකයන්ට ලබාදීමට පොරොන්දු වූ රු.10,000/=ක මුදලින් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 5/2015 අනුව රාජ්‍ය, සංස්ථා, මණ්ඩල, පළාත් ආයතන හා රජය සතු සමාගම්වලට ලබාදුන් රු.8000/=ක මුදල රාජ්‍ය ව්‍යාපෘතිවල කාර්ය මණ්ඩලවලට ලැබී නොමැති බවත්;

(ii) පෙර වැටුප් වැඩිවීම්වලදී ව්‍යාපෘතිවල සේවකයින්ටද එම වැටුප් වැඩිවීම් ලබාදීමට මුදල් අමාත්‍යාංශය කටයුතු කළ බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත අ (i) අනුව වැටුප් වැඩිවීම ලබා දී මාස 10ක කාලයක් ගතවී ඇතත්, ව්‍යාපෘති කාර්ය මණ්ඩලවලට එය ලබා නොදීමට බලපෑ හේතු කවරේද;

(ii) එම වැටුප් වැඩිවීම ව්‍යාපෘති සේවකයින්හට ලබාදීම සඳහා දැනට ගෙන ඇති පියවර කවරේද;

(iii) අදාළ වැටුප් වැඩිවීම රාජ්‍ය ව්‍යාපෘති කාර්ය මණ්ඩල සඳහා කඩිනමින් ලබාදීමට පියවර ගන්නේද;

(iv) දැනට වසර 02ක කාලයක් පුරා අත්හිටුවා ඇති ව්‍යාපෘතිවලට අදාළව සකස් කොට ඇති යෝජිත කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛය ක්‍රියාත්මක කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

476/'16

8.

ගරු කනක හේරත් මහතා,— ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) යහපාලන රජය ආරම්භ වූ දින සිට ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ ඇතැම් ඩිපෝවල සේවය කරන විවිධ තනතුරු දරන නිලධාරීන් හා සේවකයින් නොයෙකුත් අසාධාරණකම්, කරදර හා පීඩාවන්ට ලක්වී ඇති බවත්;

(ii) සමහර සේවකයින් දරන ලද තනතුරුවලින් ඉවත්කර ඇති බවත්;

(iii) එවැනි සේවකයින් අදාළ නොවන වෙනත් සේවාවල යොදවා ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම ක්‍රියාවලිය යහපාලන රජයේ ප්‍රතිපත්තිවලට පටහැනි බව පිළිගන්නේද;

(ii) එසේ නම්, අසාධාරණයට, කරදර සහ පීඩාවන්ට ලක් වූ එවැනි සේවකයින්ට සාධාරණය ඉටු කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දැනුම් දෙන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

507/'16

9.

ගරු එම්.එච්.එම්. සල්මාන් මහතා,— නිවාස හා ඉදිකිරීම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) අම්පාර දිස්ත්‍රික්කයේ, දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් පහත සඳහන් ලිපිනයන්හි පදිංචිකරුවන් ඉතා අඩු ආදායම්ලාභී ගොවි පවුල්වලට අයත් සාමාජිකයින් බව එතුමා පිළිගන්නෙහිද?

| | | |
|---|---|---|
| (i) | කේ. ජී. චන්ද්‍රසේන මහතා | 18, රිදීඇල |
| (ii) | එච්. එම්. ආරියදාස මහතා | 12, මහවැලි නිවාස අසල, චන්දනගම |
| (iii) | එම්. එම්. කේ. හේමමාලි මිය | 128/1, තුවාරගල |
| (iv) | කේ. එම්. එම්. මනෝ රංජනී මිය | බඹරවාන |
| (v) | ඒ. ඉන්ද්‍රානි මල්කාන්ති මිය | බඹරවාන |
| (vi) | කේ. එම්. කරුණාරත්න මිය | 209, රන්හෙලගම |
| (vii) | යූ. ජී. සුභාෂිණී මිය | 299/2, තුවාරගල |

(ආ) එසේ නම්, පාසැල් අධ්‍යාපනය හදාරන දරුවන් සමඟ නොයෙකුත් දුෂ්කරතා මධ්‍යයේ ජීවත්වන ඔවුන්ගේ පැල්පත් නිවාස ප්‍රතිසංස්කරණය කරගැනීම සඳහා නිවාස ආධාර ලබාදීමට පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

549/'16

10.

ගරු විමල් වීරවංශ මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) පසුගිය රජය වයස අවුරුදු 60ට වැඩි ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ රුපියල් මිලියන 01ක් දක්වා වූ ස්ථාවර තැන්පතු සඳහා සියයට 15ක පොලී අනුපාතයක් ලබා දුන් බව එතුමා දන්නෙහිද?

(ආ) (i) 2016 වසරේ සිට එම සහනය ලබන වයස් සීමාව අවුරුදු 60 සිට 55 දක්වා අඩු කිරීමටත්;

(ii) තැන්පතු මුදල රුපියල් මිලියන 1.5 දක්වා වැඩි කිරීමටත්;

(iii) මෙම පහසුකම සපයන බලපත්‍රලාභී සමාගම් සඳහා සියයට 1.5ක පොලී සහනාධාරයක් ලබාදීමටත්;

(iv) ඒ සඳහා රුපියල් මිලියන 1,500ක මුදලක් වෙන් කිරීමටත්;

මෙවර අයවැයෙන් යෝජනා කළ බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) ඊට අදාළ චක්‍රලේඛය මුදල් අමාත්‍යාංශය විසින් මේ වන විට නිකුත් කර තිබේද;

(ii) එසේ නම්, එකී සහනය ලබන ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සංඛ්‍යාව කොපමණද;

(iii) මෙම පහසුකම් සපයන බලපත්‍රලාභී මූල්‍ය සමාගම් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

559/'16

11.

ගරු එස්. ශ්‍රීතරන් මහතා,— ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කිලිනොච්චිය දිස්ත්‍රික්කයෙහි පොදු ක්‍රීඩාපිටියක් ඉදිකිරීමට යෝජනා කර ඇති බව දන්නේද;

(ii) එසේ නම්, ක්‍රීඩාපිටිය ඉදිකිරීම සඳහා මුදල් වෙන්කර තිබේද;

(iii) ඒ සඳහා වෙන්කළ මුදල කවරේද;

(iv) ක්‍රීඩාපිටියේ ඉදිකිරීම් ඇරඹීම ප්‍රමාද වීමට හේතු කවරේද;

(v) මිළ ගණන් කැඳවීම නිසි ක්‍රමවේදයක් අනුව සිදුකර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මුදල් වෙන් කිරීමේදී අක්‍රමිකතා සිදු වී තිබේද;

(ii) එසේ නම්, ඒ සඳහා ලබා දෙන විසඳුම් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

565/'16

12.

ගරු විදුර වික්‍රමනායක මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) හොරණ, රාජකීය විදුහලෙන් පළමු වරට අ.පො.ස. (සා.පෙළ) විභාගයට පෙනී සිට, ගණිතය විෂය අසමත්ව 2016 අ.පො.ස. (උ.පෙළ) විභාගයට පෙනී සිටින සිසුන් 30කට ආසන්න සංඛ්‍යාවක් චක්‍රලේඛ උපදෙස්වලට පටහැනිව විදුහල්පතිතුමා විසින් විදුහලෙන් අස්කර ඇති බවත්;

(ii) ඇතැම් සිසුන් වෙත නිකුත් කරන ලද චරිත සහතික අවලංගු කිරීම වැනි දරුවන් මානසිකව පහතට ඇද දැමීමේ කටයුතු සිදු කිරීමෙන් එම සිසුන් සහ දෙමාපියන් මහත් අපහසුතාවයට ලක් වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) අ.පො.ස. (උ.පෙළ) විභාගය පැවැත්වීමට තිබෙන ඉදිරි මාස කිහිපය විභාගයට වඩාත් සාර්ථකව මුහුණ දීමට සිසුන් සූදානම් කරන කාලය වන බැවින් එම සිසුන්ට විදුහලේ අධ්‍යාපනය ලැබීමේ අවස්ථාව අහිමිකිරීම නිදහස් අධ්‍යාපන පහසුකම් ලබා ගැනීමේ අවස්ථාව අහිමි කිරීමක් වන බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) ශ්‍රී ලංකාවේ අනාගතය භාර ගැනීමට සිටින සිසුන් මානසිකව පහතට ඇද දැමීම විදුහල්පතිවරයකුගේ යුතුකම වේද;

(ii) විදුහල්පතිවරයාගේ මෙම ක්‍රියාකලාපය හේතුවෙන් පැන නැගී ඇති ගැටලුව විසඳීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

571/'16

13.

ගරු සෙය්යිඩ් අලී සාහීර් මවුලානා මහතා,— තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මඩකලපුව දිස්ත්‍රික්කයේ, කොක්කට්ටිචෝලේ, වෙල්ලාවේලි, කිරාන්, වෙන්කලඩි, වාකරේ, වව්නතිව් යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල යුදමය වාතාවරණය අවසන්වීමත් සමඟ නැවත පදිංචි වූ ජනතාව විසින් ආර්ථික දුෂ්කරතා මධ්‍යයේ ඉදිකරගත් පැල්පත් නිවාස ගණනාවක් වන අලි ප්‍රහාර නිසා විනාශ වී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) වන අලින් විසින් විනාශ කර ඇති නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) වන අලි ප්‍රහාර නිසා මියගිය සහ ශාරීරික තුවාල ලැබූ පුද්ගලයින් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) වන අලි කඩා වැදීම නිසා කුඹුරු ඇතුළු හේන් ගොවිතැන් විනාශ වීමෙන් රැකියා අහිමිවූ පුද්ගලයින් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) නිවාස අහිමිවූවන්ට නිවාස ඉදිකර ගැනීම සඳහාත්, මියගිය, ශාරීරිකව තුවාල ලැබූ සහ රැකියා අහිමිවූ පුද්ගලයින්ට වන්දි ලබාදීම සඳහාත් වැඩපිළිවෙළක් ක්‍රියාත්මක වන්නේද;

(ii) එසේ නම්, මියගිය සහ විපතට පත්වූ පුද්ගලයින් අතරින් වන්දි ලබාදී ඇති පුද්ගලයින් සංඛ්‍යාව කොපමණද;

(iii) එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය, අනුව ප්‍රදානය කර ඇති වන්දි මුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

590/’16

14.

ගරු ලකී ජයවර්ධන මහතා,— කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාව තුළ පවතින මුළු සතොස වෙළඳ ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) එම ආයතන අතරින් රජයේ ගොඩනැගිලිවල පවත්වාගෙන යනු ලබන සතොස වෙළඳ ආයතන සංඛ්‍යාව සහ කුලී පදනම මත පවත්වාගෙන යනු ලබන සතොස වෙළඳ ආයතන සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) කුලී පදනම මත ලබාගත් ගොඩනැගිලි සඳහා කුලී ගෙවීමට සතොස මඟින් වාර්ෂිකව කොපමණ මුදලක් වැය කරන්නේද;

(ii) කුලියට ලබාගත් ගොඩනැගිලි පිහිටා තිබෙන ස්ථාන කවරේද; එම ස්ථානවල හිමිකරුවන් කවුරුන්ද සහ ඔවුන්ට මාසිකව ගෙවන කුලී මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම ස්ථානවල දැනට පවත්වාගෙන යන සහ වසා දමා ඇති සතොස ආයතන සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) සතොස වෙළඳ ආයතන පිහිටුවීමට කුලී පදනම මත ගොඩනැගිලි ලබා ගැනීමේදී විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කරන්නේද;

(ii) එසේ නම්, එම ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

103/'15

15.

ගරු බුද්ධික පතිරණ මහතා,— විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2010.01.01 දින සිට 2014.12.31 දින දක්වා කාලය තුළ කැනඩාවේදී හා ඇමරිකාවේදී මියගිය ශ්‍රී ලාංකික පුරවැසියන් සංඛ්‍යාව, එක් එක් රට අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඔවුන්ගේ නම්, වයස, ශ්‍රී ලංකාවේ පදිංචි ලිපිනය හා උක්ත රටවල්හි දී කරන ලද රැකියා කවරේද;

(iii) මෙම පුද්ගලයින්ගේ මරණවලට ආසන්නතම හේතු කවරේද;

(iv) ඔවුන් වෙනුවෙන් රජය ලබා දුන් සහන කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2010.01.01 දින සිට 2014.12.31 දින දක්වා කාලය තුළ කැනඩාවේදී හා ඇමරිකාවේදී පූර්ණ සහ අර්ධ ආබාධිත තත්ත්වයට පත් වූ ශ්‍රී ලාංකික පුරවැසියන් සංඛ්‍යාව, එක් එක් රට අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඔවුන්ගේ නම්, වයස, ශ්‍රී ලංකාවේ ලිපිනය හා උක්ත රටවල්හිදී ඔවුන් කළ රැකියා කවරේද;

(iii) මෙම පුද්ගලයින් ආබාධිත වීමට හේතු කවරේද;

(iv) ඔවුන් වෙනුවෙන් රජය ලබා දුන් සහන කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

## පනත් කෙටුම්පත් පිළිගැන්වීම පිළිබඳ දැනුම්දීම

1.

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා,— අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (පිහිටුවීම, පරිපාලනය කිරීම සහ කර්තව්‍ය ඉටු කිරීම),— අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයක් පිහිටුවීම සඳහා ද; අතුරුදහන් වූ තැනැත්තන් සෙවීම සහ ඔවුන් පිළිබඳව සොයා බැලීම සඳහා ද; අතුරුදහන් වූ තැනැත්තන්ගේ ඥාතීන්ට සහාය වීම සඳහා ද; අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ දත්ත සමුදායක් ස්ථාපනය කිරීම සඳහා ද; ඉහත කී කාර්යාලයට පවරනු ලබන බලතල හා කර්තව්‍යවලට අදාළ කාර්යපටිපාටි සහ මාර්ගෝපදේශ සකස් කිරීම සඳහා ද; මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම හා සම්බන්ධ නැතහොත් ඊට ආනුෂංගික සියලු කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනත් කෙටුම්පතකි.

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104ආ (5)(අ) ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව මැතිවරණ කොමිෂන් සභාව විසින් 2016 පෙබරවාරි 25 දිනැති අංක 1955/19 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.05.06 දින ඉදිරිපත් කරන ලද, ජනමතවිචාරණයකදී හෝ ඡන්ද විමසීමකට අදාළ කාලසීමාව තුළ විද්‍යුත් හා මුද්‍රිත ජනමාධ්‍ය විසින් පිළිපැදිය යුතු උපමාන හෙවත් මාර්ගෝපදේශ/ මෙහෙයුම් ප්‍රතිපත්ති අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*2.

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*3.

ශ්‍රී ලංකා ජාතික පර්යේෂණ සභාව පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*4.

හෝමියෝපති පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*5.

සමථ මණ්ඩල (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*6.

මූල්‍ය කළමනාකරණ (වගකීම) (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*7.

සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා,— ආනයන හා අපනයන පාලන පනත යටතේ නියෝග (අංක 1),— 1985 අංක 48 හා 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන පාලන පනතේ 4 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තිය සහ 14 වැනි වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 20 වැනි වගන්තිය යටතේ සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2016 පෙබරවාරි 11 දිනැති අංක 1953/27 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.03.10 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*8.

සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා,— ආනයන හා අපනයන පාලන පනත යටතේ නියෝග (අංක 2),— 1985 අංක 48 හා 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන පාලන පනතේ 4 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තිය සහ 14 වැනි වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 20 වැනි වගන්තිය යටතේ සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2016 පෙබරවාරි 11 දිනැති අංක 1953/28 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.03.10 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*9.

කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා,— ප්‍රමිති හා සේවා පනත යටතේ නියෝග,— 1995 අංක 35 දරන මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා පනතේ 60 වැනි වගන්තිය යටතේ ආහාර සුරක්ෂිතතාව අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 ජූලි 2 දිනැති අංක 1921/54 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.04.05 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*10.

අධිකරණ අමාත්‍යතුමා සහ බුද්ධ ශාසන අමාත්‍යතුමා,— සාපරාධී කාරණාවල දී අන්‍යෝන්‍ය සහයෝගීතාව දැක්වීමේ පනත යටතේ කරන නියමය,— 2002 අංක 25 දරන සාපරාධී කාරණාවලදී අන්‍යෝන්‍ය සහයෝගීතාව දැක්වීමේ පනතේ 2 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තිය යටතේ අධිකරණ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 අගෝස්තු 6 දිනැති අංක 1926/46 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.11.21 වැනි දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*11.

අධිකරණ අමාත්‍යතුමා සහ බුද්ධ ශාසන අමාත්‍යතුමා,— අධිකරණ සංවිධාන පනත යටතේ නියෝග,— 1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනතේ 45 වැනි වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 61 වැනි වගන්තිය යටතේ අධිකරණ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2016 පෙබරවාරි 18 දිනැති අංක 1954/34 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.03.08 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*12.

ක්‍රීඩා අමාත්‍යතුමා,— ක්‍රීඩා පනත යටතේ නියෝග,— ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 31 වැනි වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 41 වැනි වගන්තිය යටතේ ක්‍රීඩා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2013 ජනවාරි 15 දිනැති අංක 1793/3 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද, 2013 අංක 01 දරන ජාතික ක්‍රීඩා සංගම් නියෝගවල ඇතුළත් 13 සහ 17 වැනි වගන්ති සංශෝධනය කරමින් 2015 නොවැම්බර් 9 දිනැති අංක 1940/7 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.01.26 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*13.

ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා,— මෝටර් වාහන පනත යටතේ නියෝග,— (203 වැනි අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 213ඈ වගන්තිය සමඟ කියවියයුතු, එකී පනතේ 237 වගන්තිය යටතේ ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 දෙසැම්බර් 22 දිනැති අංක 1946/10 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.03.09 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*14.

බෞද්ධ විහාර දේවාලගම් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*15.

විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති පනත යටතේ රීති,— 2014 අංක 40 දරන ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති පනත ප්‍රකාරව ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව විසින් සාදන ලදුව, 2015 ජූලි 21 දිනැති අංක 1924/27 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.03.23 දින ඉදිරිපත් කරන ලද 2015 අංක 1 දරන පරමාණුක බලශක්ති (බලපත්‍ර) රීති සහ 2015 අංක 1 දරන පරමාණුක බලශක්ති (ක්‍රියා පිළිවෙතක් පැවැත්වීමේ අදහස පිළිබඳ දැනුම් දීමේ) රීති අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*16.

ථේරවාදී භික්ෂු කතිකාවත් (ලියාපදිංචි කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*17.

සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ නියෝග,— 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මගින් සංශෝධිත, 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තිය සහ 14 වැනි වගන්තිය සමඟ කියවිය යුතු, එම පනතේ 20 වැනි වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 පෙබරවාරි 26 දිනැති අංක 1903/41 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.09.23 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***